**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත, ත්‍රිකුණාමලය**

மாகாண பொதுச்சேவை ஆணைக்குழு, கிழக்கு மாகாணம், திருகோணமலை

PROVINCIAL PUBLIC SERVICE COMMISSION, EASTERN PROVINCE, TRINCOMALEE


ඔබේ අංකය / உமது இல / Your No

මගේ අංකය / எனது இல / My No — EP/07/03/02/43-06/2017

2017.07.21

ප්‍රධාන ලේකම්/ලේකම්වරුන්/නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්/

පළාත් අධ්‍යක්ෂවරුන්/කොමසාරිස්වරුන්/මහ නගර සභා කොමසාරිස්වරුන්/

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්/ නගර සභා ලේකම්වරුන්/

ප්‍රාදේශීය සභා ලේකම්වරුන්,

නැගෙනහිර පළාත.

**තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට**
**උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2016**

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **අංක 2,029 දරණ හා 2017.07.21 වන දිනැති ගැසට් පත්‍රයේ** පළකරන ලද දැන්වීම අනුව, 2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා සීමිත පදනම මත පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති පහත සඳහන් තනතුරුවල සිටින නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කර ගැසට් නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට සමාන අයදුම්පතක් සකසා නිවැරදිව සම්පූර්ණ කර ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව **2017.08.16** වන දින හෝ එදිනට පෙර මා වෙත ලැබෙන්නට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

- i. කාර්මික නිලධාරී (සිවිල්/යාන්ත්‍රික/විදුලි)
- ii. සැලසුම් ශිල්පී
- iii. ජනපද නිලධාරී
- iv. කෘෂිකර්ම උපදේශක
- v. සත්ත්ව සංවර්ධන උපදේශක

තවද නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින් ඉහත ගැසට් පත්‍රයේ 8 (iv) වන ඡේදයේ සඳහන් වටිනාකම සඳහා නැගෙනහිර පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත නමට ගෙවා ලබා ගත් රිසිට්පතක් අදාල අයදුම්පත්‍රයෙහි නොගැලවෙන සේ අලවා එවන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලෙසද කාරුණිකව දන්වා සිටිමි.

**එච්.ඊ.එම්.ඩබ්.ජී. දිසානායක,**
ලේකම්.

පිටපත ඃ- ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්. - අ.ක.ස.


**தொலை பேசி / දුරකතන / Telephone**

| | | |
|---|---|---|
| அலுவலகம் / කාර්යාලය / Office | : 026 2220092 | 198, உட்துறைமுக வீதி, திருகோணமலை |
| தொலைநகரி / ෆැක්ස් / Fax | : 026 2222174 | 198, ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලය |
| மின்அஞ்சல் / විද්‍යුත් තැපෑල / E-mail | : ppsc@ep.gov.lk | 198, Inner Harbour Road, Trincomalee |